**ආයතනයේ නම :- වාරිමාර්ග අමාත්‍යාංශය**

පාර්ලිමේනතුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

**நிறுவனத்தின் பெயர்:- நீர்ப்பாசன அமைச்ச**

பாராளுமன்றத்தின் அரச கனக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Name of the institution :- Ministry of Irrigation**

Submission of observation of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of standing Order No .119(4)

ආකෘතිපත්‍ර (අංක 1)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක :- 79

ආයතනයේ නම :- වාරිමාර්ග අමාත්‍යාංශය

| | කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 1. | විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම. | මෙම අමාත්‍යාංශය යටතේ, ආයතන හා රට පුරා ව්‍යාප්තව පවතින ව්‍යාපෘති ගණනාවක් පවතින අතර එම ආයතන හා ව්‍යාපෘති සඳහා නිකුත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේදී එම ආයතන/ ව්‍යාපෘතිවලින් තොරතුරු ගෙන්වා ගත යුතු වේ. එහිදී යම් කාලයක් ගත වන බැවින් ඇතැම් විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වේ. එවැනි අවස්ථාවලදී පිළිතුරු සැපයීම සඳහා ලබා දෙනු ලබන කාලය දීර්ඝ කර ගැනීම සඳහා සහකාර විගණකාධිපති/ විගණන අධිකාරිගේ අනුමැතිය ලබා ගනු ලැබේ. |
| 2. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම. | අභ්‍යන්තර විගණන විමසුම සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට නිලධාරීන්ට ලබා දෙන ලද උපදෙස්වලට අනුව මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ගත වීමට පෙර පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. |
| 3. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌනතා පිළිබඳව වන නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු අවසන් කර ඇත. |
| 4. | සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැති වීම. | වාහන කිහිපයක පමණක් අයිතිය තහවුරු කර නොමැති අතර එම වාහනවල අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 5. | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි. | මේ වන විට එවැනි ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ නොමැති අතර එසේ ගැලපුම් කළ යුතු ශේෂ පවතීනම් මසක් ඇතුලත මුදල් රෙගුලාසි අනුව කටයුතු කරනු ලැබේ. |
| 6. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම. | මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන වාරිමාර්ග කළමණාකරණ අංශයේ වසර 20 ක පමණ සිට පැවත එන මෙම හඳුනා ගැනීමට නොහැකි ණය ශේෂය වන රු.434,066.03 ක මුදල |

| | | |
|---|---|---|
| | | PFD/RED/REG/CIR/2023/04 අංක දරණ2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 යටතේ කපා හැරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.<br><br>අනෙකුත් සියළු හිඟ ණය ශේෂ මේ වන විට හඳුනාගෙන ඇති අතර ඉන් කොටසක් මේ වන විට නිරවුල් කර ඇති අතර කොටසක් අය කර ගනිමින් පවතී. |
| 7. | 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පිරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි /සේවාලාබී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට අදාල චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි /සේවාලාබී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කර ඇත. |
| 8. | ආයතනයේ පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මේ වන විට පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හා ඇගයුමට භාජනය කිරීමට අදාල ක්‍රමවේද සකස් කර ඇත. |
| 9. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය. | විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී තිබූ ආයතනයේ ගිණුම්වල පැවති අඩුපාඩු සහ දෝෂ මේ වන විට නිවැරදි කර ඇත. |
| 10. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශය සම්බන්ධයෙන් වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර ඇත. |

කේ. ඩී. ලාල්කාන්ත (පා.ම)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග
අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය
අංක : 500,
ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

2025.09.01